**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව - 2018**
-----------------------------------------------------

## 1.1 විගණනය කළ මතය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 1.2 විගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය විගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. විගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-------------------

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------

| | අනුකූල නොවීම<br>--------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>-------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | පශ්චාත් සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් සිදු කිරීමට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි 9 ඡේදයෙහි දක්වා ඇති පරිදි සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හඳුන්වා දී ඇති ප්‍රමිතීන් හා ව්‍යවහාරයන්ට අනුකූල වන පරිදි සකස් කර ගත යුතු වුවද ඊට අනුකූල නොවන ලෙස සේවකයින්ගේ සේවා කාලය හා අවසන් වරට ලබාගත් වැටුපෙන් භාගයක් ලෙස පශ්චාත් සේවක ප්‍රතිලාභ ලෙස සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 17 ක් වෙන්කර තිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි දක්වා ඇති ආකාරයට 2018.12.31 දිනට සේවක පාරිතෝෂික ගෙවීම් සඳහා සංශෝධිත වෙන් කිරීම සිදුකර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි විධිවිධාන ප්‍රකාරව පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන් කිරීම් සඳහා ප්‍රතිපත්තියක් හඳුනාගෙන ඒ අනුව වෙන් කිරීම් කළ යුතුය. |
| (ආ) | ප්‍රමිත අංක 07 අනුව වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශණ මඟින් ඉදිරිපත් කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති පිරිවැය රු. 4,586,223 ක් වූ ගොඩනැගිලි සාධාරණ වටිනාකමට ප්‍රත්‍යාගණනය කර ගිණුම් වලට ගෙන නොතිබුණි. | 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ප්‍රත්‍යාගනිත වටිනාකම සැලකිල්ලට ගනිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව සභාව සතු ගොඩනැගිලිවල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල පෙන්වීමට ප්‍රත්‍යාගණනයකළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

| | විගණන නිරීක්ෂණය<br>--------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>--------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල ලැබිය යුතු පොලී ආදායම වූ රු. 33,546,865 ක් හා මුදලින් ලද රු. 151,435,201 ක පොලී ආදායම මෙහෙයුම් කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයෙන් අඩුකර දැක්විය යුතු වුවත් ලැබිය යුතු පොලී ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ අතර වෙනස වූ රු. 29,982,748 ක් | සංශෝධිත මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදිව හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි විධිවිධාන ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පමණක් අඩු කිරීම හේතුවෙන් මෙහෙයුම් කටයුතුවල මුදල් ප්‍රවාහය රු. 154,999,308 ක් වැඩියෙන්ද ආයෝජන කටයුතුවල මුදල් ප්‍රවාහය රු. 151,435,201 ක් අඩුවෙන්ද සටහන් වී තිබුණි. | | |
| (ආ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුලත් නොවූ වටිනාකම රු. 258,353 ක් වූ බැර ශේෂයක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ සටහන් කිරීම හේතුවෙන් එම වටිනාකමින් මෙහෙයුම් කටයුතුවල මුදල් ප්‍රවාහය වැඩියෙන් සටහන් වී තිබුණි. | සංශෝධිත මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදිව සටහන් කිරීමට කටයුතු කරනු ඇත. | මුදලින් ලැබීම් හා මුදලින් ගෙවීම් නිවැරදිව හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ කළුතර දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය වෙත සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු රු. 11,799,600 ක් වූ කළුගල් ආදායමක් ගිණුම් මගින් සටහන් නොකිරීම හේතුවෙන් එම අගයෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය අඩුවෙන් සටහන් වී තිබුණි. | කළුගල් බදු දීම සිදුකරන ව්‍යාපෘති අංශයෙන් ලද වාර්තාව අනුව ගිණුම් සකස් කර ඇති බවත් ඉදිරියේ දී නිවැරදි කරමි. | නිවැරදි තොරතුරු ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය |

## 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2011 වර්ෂයේ දී ගනු ලැබූ අංක 11/විවිධ (015-1) දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අක්කර 05 ට වැඩි ඉඩම් බදු දීමේ දී සභාවේ සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ නොමැතිව, කළුතර පිහිටි මැද්දෙගෙදර වතුයායට අයත් ඉඩම් අක්කර 80 ක් බදුකරුවන් 04 දෙනෙකු වෙත පොල්, තේ, කටුපොල් සහ මිශ්‍ර භෝග සඳහා 2016 හා 2017 යන වර්ෂවලදී බදු දී තිබූ අතර එම ඉඩම් සඳහා රජයේ තක්සේරු වටිනාකම් ලබා නොගැනීම හේතුවෙන් රු. 1,478,000 ක මූලික වටිනාකම ලබා ගැනීමට අමතරව වාර්ෂික බදු මුදල් අයකරගෙන නොතිබුණි. | කොමිෂන් සභා අනුමැතියෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර ඇතත් මේ දක්වා අනුමැතිය ලැබී නැත. | පනතේ විධිවිධාන ප්‍රකාර විධිමත් පරිදි අනුමැතිය ලබා ගෙන ගිවිසුම්ගතව නිවැරදි තක්සේරුව මත බදු දීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාවට අයත් ඔලබොඩුව, යහල කැලේ හා ඉංගිරිය වතුවලට අයත් අක්කර 22 ක භූමියක පිහිටි කලුගල් 2001,2004 හා 2005 යන වර්ෂවලදී බදු දී තිබූ අතර, මිල්ලනිය හොරේකන්ද වතු යායට අයත් අක්කර 10 ක ඉඩමක පිහිටි කළු ගලක් 2003 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම අනවසරයෙන් කැනීම්කර තිබුණි. බදුකරුවන් විසින් බදු මුදල් නොගෙවීම හා අදාල ආයතන මගින් අනුමැතිය ලබා නොගැනීම හේතුවෙන් සභාව අදාල ගිවිසුම් අවලංගු කර තිබුණද අනවසර | කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව මෙම ඉඩම්වල පවත්වාගෙන යනු ලැබූ කළුගල් වැඩපලවල් සියල්ල අත්හිටුවීමටත් අයවිය යුතු සියලු මුදල් කොමිෂන් සභාවට ගෙවන අයට පමණක් අදාල අවසරය ලබා දීමටත් කටයුතු කර ඇත. විධිමත්ව මෙම කළු ගල් ව්‍යාපෘතිය | පාරිසරික අනුමැතීන් මත විධිමත් පරිදි බදු දිය යුතු වීම සහ එම ව්‍යාපෘතීන් පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කිරීම් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කැනීම් නතර කිරීමට කටයුතුකර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 30 වන විට අයවිය යුතු හිඟ බදු මුදල රු. 47,433,565 ක් වී තිබුණි. | පවරා දීම සඳහා කටයුතු කිරීමට මැනුම් නියෝගයක් නිකුත් කර ඇති අතර එම මැනුම් නියෝගයේ අදාල ගණනය කිරීම්ද සිදු කරන ලෙස උපදෙස් දී ඇත. | |
| (ඇ) | සභාවට අයත් මැද්දේ ගෙදර වත්තෙන් අක්කර 04 රූඩ් 03 පර්චස් 03 ක් වූ ඉඩමක බාහිර පාර්ශවයක් විසින් 2002 වර්ෂයේ සිට අනවසරයෙන් භුක්ති විඳින අතර අදාල පාර්ශවය විසින් එම ඉඩමෙහි කාමර 04 ක්, කබානා 10 ක් හා ස්වභාවික නාන තටාකයක් සහිත හෝටලයක් ඉදිකර තිබූ අතර පර්චස් 10 ක් පමණ විශාල නානතටාකයක්ද සමාලෝචිත වර්ෂය වන විට ඉදිකරමින් පැවතුණි. එම ඉඩම අත්පත්කර ගැනීමට හෝ බදු පදනම මත ලබා දීමට සමාලෝචිත වර්ෂය අවසන්වන විටත් සභාව විසින් කටයුතු කර නොතිබුණි. | කොමිෂන් සභාව විසින් අනුගමනය කරන ඉඩම් බදු දීමේ ක්‍රියා පටිපාටිය අනුව බදු ගිවිසුමක් මගින් පවරා දීමට කටයුතු කරන අතර 2002 වර්ෂයේ සිට හිග බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත. | අනවසර හඳුනා ගැනීමට දිස්ත්‍රික් නිලධාරීන් කටයුතු කලයුතු අතර ඒ සඳහා තොරතුරු මහජනතාවට ලබා දීමේ විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර අනවසර පරිහරණය සම්බන්ධයෙන් නීතිමය පියවර ගත යුතුය. |

### 1.5.4 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 1972 වර්ෂයේ කොමිෂන් සභාව පිහිට වූ දින සිට අත්පත් කරගත් ඉඩම්වලට අදාල එම ඉඩම්වල අක්කර ගණන එක් එක් ඉඩම් පිහිටි ප්‍රදේශ, අත්පත් කරගනු ලැබුවේ කවරෙකුගෙන්ද, දැනට බුක්තිය පවරාදීම් පිළිබඳ විස්තර හා අදාල ගැසට් නිවේදන සහ ඉඩම් බැහැර කිරීම්වලට අදාල සියලුම විස්තර පිළිබඳ වූ සම්පූර්ණ විස්තර ඇතුලත් ලේඛනයක් ආයතනය විසින් නඩත්තු කර නොතිබූ අතර ඒ පිළිබඳ උපයෝගී ලියවිලි මඟින් පැහැදිලි කිරීමටද ආයතනය අපොහොසත් විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු. 676,169,345 ක් වූ පවරාගත් ඉඩම්වල පැවැත්ම හා අගය කිරීමේ නිවැරදිතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | සභාව සතුව නිසි පරිදි යාවත්කාලීන වන ඉඩම් ලේඛනයක් නොමැති වීමත් එකිනෙක ඉඩමේ නිශ්චිත පිරිවැය වටිනාකම එම ලේඛනයේ දක්වා නොමැති වීමත් සහ විකුණුම් කල ඉඩම් වල පිරිවැය නිශ්චිතව සොයාගත නොහැකි වීම. | යාවත්කාලීන ඉඩම් ලේඛනයක් නඩත්තු කළ යුතු බව හා මේ දක්වා යාවත්කාලීන ලේඛනයන් නඩත්තු නොකිරීම සම්බන්ධයෙන් ඊට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධව කටයුතු කිරීම. |

## 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ගොඩනැගිලි හා මෝටර් රථ | **82,656,308** | සමීක්ෂණ වාර්තා සහ උප ලේඛන | මෙම ගොඩනැගිලි වටිනාකමින් රු. 4,207,821 ක් විස්තරාත්මක තොරතුරු රහිතව 2009 වර්ෂයේ දී ඉදිරියට ගෙනා ශේෂයකි. අනුශාංගික සාක්ෂි සොයාගත නොහැකිය. ඉතිරි රු. 9,876,662 සඳහා අනුශාංගික සාක්ෂි සොයා ගත හැකිය. එම වටිනාකම එම ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කර 2019 වර්ෂයේ වියදම්වල ඇතුලත් කිරීමට කටයුතු කරමි. මෝටර් රථ වටිනාකම තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යවා ඇත. | ගොඩනැගිලි පිළිබඳ උපලේඛනයක් සකස් කිරීම හා වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණය කර වටිනාකම තහවුරු කරගත යුතුය. |
| (ආ) | ලැබිය යුතු බදු කුලී | **16,708,318** | ආරම්භක ශේෂයේ වෙනස සඳහා ජනල් සටහන් ගැලපීම් වලට අදාල විස්තර | බදුකරුවන් විසින් අදාල හිඟ බදු මුදල් දිස්ත්‍රික් කාර්යාලය වෙත ගෙවනු ලැබේ. ඒ සඳහා අදාල රිසිට්පත් ප්‍රධාන කාර්යාලයේ ආදායම් අංශය වෙත ප්‍රමාද වී ලැබීම හේතුවෙන් එය පසුගිය බදු වර්ෂයේ ශේෂයන්ට අදාලව ලෙජරයේ ගැලපීම් සිදු කිරීම මත ආරම්භක ශේෂය වෙනස් වී ඇත. | ජනල් සටහන් මගින් ගැලපීමේ දී ඒ සඳහා අදාල විස්තර ජනල් වවුචරය සමග ඉදිරිපත් කල යුතුය |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 13 කට අධික කාලයක සිට පැවත එන රාජ්‍ය ආයතන 8 කින් අයවිය යුතු රු.2,135,625,246 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | නිවැරදි තොරතුරු නිසි පරිදි සොයා ගැනීමට ඇති අපහසුව හේතුවෙන් නිවැරදි තොරතුරු ලබා ගැනීමට නොහැකි වී ඇත. ණය ගැති මුදල සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | අදාල අංශ වලින් නිවැරදි තොරතුරු ලබාගෙන අයකිරීමට කටයුතු කඩිනමින් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1999 වර්ෂයේ සිට පැවත එන වටිනාකම රු.2,311,017 ක් වු ණය ගැති ශේෂ 08 ක් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ලිපි ගොනු නිසි පරිදි සොයා ගැනීමට ඇති අපහසුව හේතුවෙන් නිවැරදි තොරතුරු ලබා ගැනීමට නොහැකි වී ඇත. ණය ගැති මුදල සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | අදාල අංශ වලින් නිවැරදි තොරතුරු ලබාගෙන අයකිරීමට කටයුතු කඩිනමින් කල යුතුය. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු යටතේ දක්වා ඇති ආයතන 07 කින් ලබාගත් රු. 777,917 ක අත්තිකාරම් හා වෙනත් කරුණු මත ලබාගන්නා ලද මුදල් වසර 12 කට අධික කාලයක් ආයතනයෙහි රඳවාගෙන තිබුණු අතර ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ගෙවිය යුතු ණයහිමි ශේෂ වසර 12 කට වඩා පැරණි බැවින් නිශ්චිත ශේෂ තහවුරුවක් ලබා ගැනීමකින් තොරව ගෙවීම් කල නොහැකි බව හා මේ දක්වා ණයහිමි ශේෂයට අදාලව කිසිදු තහවුරුවක් ලැබී නොමැත. | කඩිනම් ශේෂ සනාථ ලබාගෙන ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉඩම් බදු දීමේදී ලබාගෙන ඇති වටිනාකම රු. 13,580,850 ක් වු අත්තිකාරම් වර්ෂ 7 සිට 13 දක්වා කාලයක් ඉක්මවා ඇතත් සමාලෝචිත වර්ෂය දක්වාම නිරවුල් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | 2002-2004 කාල සීමාවේ බදු පදනමට ලබාදී පසුව අමාත්‍ය මණ්ඩල සංදේශයකින් තහනම් කරන ලද ඉඩම් සඳහා අයකරගත් අත්තිකාරම් මුදල් ඉඩම් ගැටලු නිසි පරිදි නොවිසඳීම මත තවදුරටත් ගිණුම්වල පෙන්නුම් කර ඇත. | කඩිනමින් ගැටළු නිරාකරණය කර අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | කාර්යය නිම වී වර්ෂ 10 කට වැඩි කාලයක් ගත වී තිබුණද, ඉඩම් විකිණීමේ දී ලබාගෙන තිබු වටිනාකම රු. 11,702,992 ක් වු අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාව කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කැබිනට් අනුමැතිය ඉල්ලා ඇති අතර අනුමැතිය ලද පසු ඉදිරි කටයුතු සිදුකිරීම. | කඩිනමින් කැබිනට් අනුමැතිය ලබාගෙන අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම නොවෙනස්ව පැවති වටිනාකම රු. 109,959,493 ක් වු වන්දි අවිනිශ්චිත II ගිණුමේ බැර ශේෂය නිරවුල් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | මෙය රන්පවුම් වතු වලට යොදා ගන්නා බව හා මෑතකදී වන්දි ගෙවීම සිදු නොකිරීම. | තොරතුරු සොයා බලා හිමිකරුවන්ට වන්දි ගෙවීමට කටයුතු කල යුතුයි. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

---------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | --------------- | -------------------- | -------------------- | -------------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>---------------- | | | |
| (i) | මුදල් රෙගුලාසි 756 හා 757 | සමාලෝචිත වර්ෂය අවසන් දිනට වටිනාකම රු. 2,551,710 ක් වූ ලිපි ද්‍රව්‍ය ශේෂයේ නිවැරදිතාවය තහවුරුකර ගැනීමට භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ලිපි ද්‍රව්‍ය තොගයට අදාල විස්තර ගබඩාව මගින් පවත්වාගෙන යන ලෙජර මගින් තහවුරු කර ගත හැකිය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලිපි ද්‍රව්‍ය තොග සම්බන්ධව සමීක්ෂණ කර භෞතික පැවැත්ම තහවුරු කරගත යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 371(5) | කාර්ය නිම කර දින 10 ක් ඇතුලත අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත් 2017 වර්ෂයේ අවස්ථා 02 දී හා සමාලෝචිත වර්ෂයේ අවස්ථා 59 කදී ලබාගත් වටිනාකම වූ රු. 3,210,180 ක් වූ අත්තිකාරම් පියවීමට දින 16 සිට දින 397 දක්වා කාලයක් ගත වී තිබුණි. | නිලධාරීන්ගේ කාර්ය බහුලත්වය නිසාවෙන් හා ඔප්පු ප්‍රධානෝත්සවය පැවැත්වීම නිසාවෙන් අත්තිකාරම් මුදල් පියවීම ප්‍රමාදවී ඇති බවත් ඉදිරියේදී අත්තිකාරම් මුදල් ලබාදීම හා පියවීම පිළිබද මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී. | මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව අත්තිකාරම් මුදල් කාර්ය නිමකල වහාම පියවිය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදය2.5.3 ඡේදය | ද්විතියික පදනම මත සේවය කරන නිලධාරියෙකුට නිවාස දීමනා හා සංග්‍රහ දීමනා හිමි නොවුවද, ද්විතියික පදනමට පත්වීම් ලද නිලධාරීයෙකු සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු. 540,000 ක් නිවාස හා සංග්‍රහ දීමනා ලෙස ගෙවා තිබුණි. | කඩිනම් ඔප්පු ලබා දීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ දී රාජකාරී ඉටු කිරීමේ අවශ්‍යතාවය මත කොමිෂන් සභා අනුමැතියෙන් ලබා දී ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2015 ජූනි 17 දිනැති අංක PED3/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 ඡේදය | චක්‍රලේඛය අනුව සභාවේ සභාපති සහ විධායක අධ්‍යක්ෂවරයාට නිවාස සහ සංග්‍රහ දීමනාවක් හිමි නොවූවද සභාපති හා විධායක අධ්‍යක්ෂකවරයාට එම දීමනා ලෙස එකතුව රු. 1,200,000 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | කඩිනම් ඔප්පු ලබා දීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ දී රාජකාරී ඉටු කිරීමේ අවශ්‍යතාවය මත කොමිෂන් සභා අනුමැතිය ලබා දී ඇත. | චක්‍ර ලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2000 ජනවාරි 11 දිනැති අංක PF/ PE5 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | චක්‍රලේඛයේ පරිදි අදාල අනුමැතිය ලබා නොගෙන මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා මාසිකව රු. 2,000 බැගින් රු. 10,293,933 ක විශේෂ දීමනාවක්ද මාණ්ඩලික නිලධාරීන් සඳහා නිවාඩු දින වැටුපට අමතරව විශේෂ දීමනාවක් හා මාණ්ඩලික නොවන නිලධාරීන්ට අනුමත අතිකාල පැය ගණනට අමතරව වැඩ කරන පැය ගණන සඳහා එකතුව රු. 8,450,714 ක දීමනාවක් ද ගෙවා තිබුණි. | කඩිනම් ඔප්පු ලබා දීමේ වැඩ සටහනට සමස්ථ කාර්ය මණ්ඩලයම දායකත්වය ලබා දීම, කාර්යාල වේලාවෙන් පසුව හා සති අන්ත නිවාඩු දිනවල රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | චක්‍රලේඛය ප්‍රකාරව අනුමැතිය ලබා ගත යුතුය |
| (ඉ) | 2004 ජූලි 29 දිනැති අංක PED 25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | රාජ්‍ය ව්‍යවසායන් හි අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද එසේ නොමැතිව රු.1,756,679,568 ක අතිරික්ත මුදලක් සමාලෝචිත වර්ෂයේ දී සභාව විසින් බැංකුවල ආයෝජනය කර තිබුණි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ලිඛිතව කරුණු දක්වමින් අවස්ථා කිහිපයකදීම අනුමැතිය ඉල්ලා සිටියද මේ දක්වා නියමිත අනුමැතිය ලැබී නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව අදාල අනුමැතිය ලබාගෙන අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කල යුතුය. |
| (ඊ) | 2017 පෙබරවාරි 17 දිනැති කොමිෂන් සභා තීරණය (පත්‍රිකා අංක 9676) | කළුගල් ඉඩම් බදු දීමේදී, වර්ෂයක කාලයක් සඳහා බල පැවැත්වෙන පරිදි ලිඛිත බදු ගිවිසුම් ලබා දිය යුතු බවත්, බදු දීම මධ්‍යම පරිසර අධිකාරිය, භූ විද්‍යා හා පතල් කාර්යාංශය වැනි අනෙකුත් ආයතන වල නිර්දේශ මත කල යුතු බවත් දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම බදු ගිවිසුම් හා අදාල නිර්දේශ නොමැතිව කළුගල් ඉඩම් බදු දී තිබුණි. | වර්තමානයේ දී මෙම ආයතනවල නිර්දේශයන් නොමැතිව අදාල ව්‍යාපෘති සඳහා කොමිෂන් සභාවේ අවසරය ලබා ගැනීමට කොමිෂන් සභා පත්‍රිකා ඉදිරිපත් කරනු නොලබයි. වර්ෂයක කාලයක් සඳහා බල පවත්වන පරිදි ගිවිසුම් ලබා දීමට කටයුතු ආරම්භ කර ඇත. | අදාල ආයතනවල නිර්දේශ ලබාගෙන ගිවිසුම්ගත වීමෙන් පසු කළුගල් ඉඩම බදු දිය යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | 2018 අගෝස්තු 18 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ | කාරක සභාව විසින් ලබා දී ඇති පහත සඳහන් නිර්දේශ 2019 අගෝස්තු වන විටද ක්‍රියාත්මක කර නොතිබුණි.<br><br>i. දැනට ලේඛණගත කොට ඇති ඉඩම් අක්කර ලක්ෂ 10 නිවැරදි නොමැති බැවින් එය විධිමත්ව ලැයිස්තුගත කිරීම සඳහා විශේෂ කාර්යසාධන බලකායක් පිහිටුවීම.<br><br>ii. ලිපි ලේඛනවල ඇති අඩුපාඩු නිසා රු. බිලියන 2 ක් වන අයකර ගත නොහැකි ණය ශේෂයන් සම්බන්යෙන් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම. | ණය ගැති ශේෂයන් සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. | පොදු ව්‍යාපාර පිළිබද කාරක සභා නිර්දේශ පරිදි අදාල කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කළ යුතුය. |

**1.8** **මුදල් කළමනාකරණය**

**-----------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

| | **විගණන නිරීක්ෂණය**<br>------------------------- | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**<br>---------------------------------- | **නිර්දේශය**<br>-------------- |
|---|---|---|---|
| (අ) | 2008 මාර්තු 03 දිනැති අංක 1/2008 දරණ භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය අනුව වසර දෙකකට හෝ ඊට වැඩි කාලච්ඡේදයක් සඳහා වන ස්ථාවර තැන්පත් වල මුදල් තැන්පත් කල යුතු බව සඳහන් වුවද සභාව විසින් රු. 1,562,268,068 ක මුදලක් ස්ථාවර තැන්පතු 97 ක් යටතේ උපරිම වසරක කාලයක් සඳහා ආයෝජන කර තිබුණි. | වසරක කාලයක් සඳහා ආයෝජනය කර ඇති මෙම මුදලින් කොටසක් හෝ වසරකට වඩා වැඩි කාලයක් සඳහා ආයෝජනය කිරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලුම් කර ඇති අතර මෙතෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව තැන්පත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අවස්ථා 7 කදී රු. 110,000,000 ක මුදලක් වර්ෂයකට වඩා අඩු කාලච්ඡේදයකට අවම පොළී අනුපාතයකට ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබීම හේතුවෙන් වර්ෂයකට තැන්පත් කලේනම් ලැබීමට තිබූ පොලී මුදල වන ආසන්න වශයෙන් රු. 825,000 ක අදායමක් උපයා ගැනීමට තිබූ අවස්ථා අහිමි වී තිබුණි. | කිනම් හෝ අවස්ථාවක කොමිෂන් සභාවට වන්දි ගෙවීමට සිදු වුවහොත් ස්ථාවර තැන්පතු කල්පිරෙන තෙක් නොසිට ආපසු ගැනීමට ස්ථාවර තැන්පතු වලින් කොටසක් වසරකට වඩා අඩු කාලයක් සඳහා ආයෝජනය කිරීම. | වැඩි පොළී ආදායමක් ලබා ගත හැකි පරිදි ආයෝජනය කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 121,635,246 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 202,512,913 ක් විය.ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 80,877,667 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ මෙම පිරිහීමට මූලික වශයෙන් කළුගල් ආදායම හා අධිභාර ආදායම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුත්තලම දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉරණවිලවත්ත ඉඩම 2000 වර්ෂයේ සිට අනවසර පරිහරණය කරමින් අක්කර 40ක ප්‍රමාණයක් පුද්ගලයින් 10 දෙනෙකු විසින් ඉස්සන් වගා කිරීම සඳහා යොදාගෙන තිබුණු අතර ඉහත ඉඩම නීත්‍යානුකූලව දීර්ඝකාලීන බදු පදනමට ලබාදීමට කටයුතු කරන තෙක් 2014 වර්ෂයේ සිට අක්කරයකට රු. 10,000 බැගින් අයකිරීමට සභාපති අනුමැතිය මත සහ පනතේ 22 (1) (අ) ප්‍රකාරව 2000 වර්ෂයේ තක්සේරුව මත 2001 ජනවාරි 17 දින සිට බදු පදනම මත ඉඩම ලබාදීමට තීරණය කර තිබුණ ද 2018 දෙසැම්බර් දක්වාම එම තීරණය ක්‍රියාත්මක කර නොතිබුණි. | බදු මුදල් ගෙවීම පැහැර හැර ඇති පුද්ගලයන් හා ආයතන සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට සාකච්ඡා මාර්ගයෙන් තීරණය කරමි. | ආයතනය අයකර ගත යුතු බදු මුදල් නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතු බව හා ඊට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |
| (ආ) | පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි කුසල බී වත්ත ඉඩමෙන් අක්කර 59 ක ප්‍රමාණයක් 1994 වර්ෂයේ පෞද්ගලික සමාගමක් වෙත ඉස්සන් වගා කිරීමේ ව්‍යාපෘතියක් සඳහා බදු පදනමට ලබාදී තිබුණද 1999 වසරේ සිට 2002 දක්වා ගෙවීමට ඉතිරිව තිබූ හිඟ බදු මුදල රු. 850,000 ක් පමණ වූ අතර සමාගම විසින් 2004 වර්ෂයේ බදු ගිවිසුම උකස් තබා බැංකු ණය මුදලක් ලබාගෙන එම ණය මුදල ආපසු බැංකුවට නොගෙවීම හේතුවෙන් 2011 වර්ෂයේ බදු අයිතිය බැංකුව සතු කර ගෙන තිබුණත් ඒ සම්බන්ධව කොමිෂන් සභාව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමටත් 2018 වර්ෂය දක්වා අයකිරීමට තිබූ රු. 8,166,687 ක් වූ බදු මුදල අයකිරීමටත් කටයුතු කර නොතිබුණි. | බදු මුදල් ගෙවීම පැහැර හැර ඇති පුද්ගලයන් හා ආයතන සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට සාකච්ඡා මාර්ගයෙන් තීරණය කළෙමි. | ආයතනයේ නියමිත ක්‍රම වේදයට අනුව ඉඩම් බදු දීම, පසු විපරම් කිරීම, බදු නොගෙවන්නන් සම්බන්ධයෙන් නියමිත කාල සීමාව තුල නීත්‍යානුකූල කටයුතු සිදු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි කුඹුටුකුලිය වත්ත නැමැති ඉඩමෙන් අක්කර 74 රූඩ් 02 පර්චස් 23 ක් ඉස්සන් ගොවිපලක් සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2009 නොවැම්බර් 10 දින වසර 30 ක කාලයක් සඳහා බදු පදනමට ලබා දී තිබුණි. 2010 වසර වන විට ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණු බැවින් 2014 අගෝස්තු වන විට ඉඩමේ බුක්තිය පමණක් ආපසු කොමිෂන් සභාවට පවරාගෙන තිබුණද 1998 ජනවාරි සිට 2014 අගෝස්තු දක්වා අයවිය යුතු රු. 8,250,000 ක හිඟ බදු මුදල 2019 මැයි 30 දක්වාම අයකරගෙන නොතිබුණි. | සමාගමට එරෙහිව දිසා අධිකරණය නඩුව විභාග වෙමින් පවතී. | දිස්ත්‍රික් කාර්යාල මගින් අදාල දිස්ත්‍රික්වල ඉඩම් සම්බන්ධයෙන් අධීක්ෂණය හා පසු විපරම් කර ලැබිය යුතු මුදල් කඩිනමින් ලබාගත යුතුය. |
| (ඈ) | 2002 සිට 2004 දක්වා සභාවේ ව්‍යාපෘති සඳහා ඉඩම් බදු දීමේ ක්‍රමවේදයට පරිබාහිරව ඉඩම් අත්සතු කර තිබූ අතර 2004 වර්ෂයේ කැබිනට් පත්‍රිකාවක් මඟින් එම ක්‍රියාවලිය තහනම් කර තිබුණි. එම ඉඩම් භුක්තියට පවරාදීමක් හා භුක්තියට පවරාදීමක් සිදු නොකරන ලද ලෙස විධි 02 කින් ලැයිස්තු ගත කර තිබුණි. භුක්තියට පවරා දෙන ඉඩම් අතරින් අක්කර 760 පර්චස් 31 ක් ආපසු බාරදී නොතිබුණි. භුක්තිය භාර නොදුන් අක්කර 1689 ක් සඳහා ලබා දී තිබූ අත්තිකාරම් මුදල් එම ඉල්ලුම්කරුවන්ට ආපසු ලබා දීමට කටයුතු කර නොතිබුණු අතර එම ඉඩම් පිළිබඳ පසුවිපරම් කටයුතු ද සිදුකර නොතිබුණි. | 2018.08.23 දිනැති පොදු ව්‍යාපාර කාරක සභාවේ සාකච්ඡාවට අනුව ලබාදුන් උපදෙස් අනුව කටයුතු කරමින් පවතී. | පොදු ව්‍යාපාර කාරක සභාවේ තීරණය ක්‍රියාත්මක කල යුතුය. |
| (ඉ) | කළුතර දිස්ත්‍රික් බලමණ්ඩලයේ ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් නිරීක්ෂණය වූ පරිදි ඔප්පු ඉල්ලුම් කිරීමේ ලේඛණය අනුව 2016 වර්ෂයේ සිට 2018 සැප්තැම්බර් මාසය දක්වා පුද්ගලයින් 467 ක් ඔප්පු ඉල්ලුම්කර තිබුණද අදාල කාලපරිච්ඡේදය තුල ඔප්පු 24 ක් පමණක් නිකුත් කර තිබුණි. තවද එම දිස්ත්‍රික්කයේ සමාලෝචිත වර්ෂය වන විට සිටින අනවසර පදිංචිකරුවන් 4213 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විවිධ වැඩසටහන් යටතේ ලබා දී ඇති ඔප්පු ප්‍රමාණය 2027 ක් බව දක්වා ඇත. අනවසරකරුවන් නියමානුකූල කිරීමට අදාලව ඉදිරි කටයුතු ඔප්පු ලබා දීමේ ක්‍රියාමාර්ගය යටතේ කඩිනමින් සිදුකරනු ඇත. | ඉඩම් ඉල්ලුම්කරන ලද පුද්ගලයින් වෙත ඔප්පු ලබා දිය යුතුය. අනවසරකරුවන් ඉවත් කිරීමට කටයුතු කලයුතු අතර සභාව සතු ඉඩම් වලට අනවසරකරුවන් ඇතුල් වීම වලක්වා ගැනීමද කල යුතුය. |
| (ඊ) | නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඉඩම් අක්කර 05 ක වසර 10 ක් පමණ අනවසරයෙන් පළතුරු වගාකර තිබුණු අතර අනවසරකරු විසින් බදු ඔප්පුවක් ලබා දෙන ලෙස 2002 වර්ෂයේ ලිපියකින් ඉල්ලා තිබුණත් ඉඩමේ භුක්තිය නීත්‍යානුකූලව පැවරීමට හෝ ආපසු පවරා ගැනීමට කටයුතු නොකිරීම නිසා ඉඩමෙන් උපයාගැනීමට තිබූ වසර 16 ක පමණ ආදායම සභාවට අහිමි වී තිබුණි. | පැහැදිලි පිළිතුරක් ලබා දී නැත. | අදාල ඉඩම් පිළිබඳ පරීක්ෂා කර සුදුසු කටයුතු නොකිරීම හේතුවෙන් වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කිරීම. |

3.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ඉඩම් ඔප්පු දස ලක්ෂයක් ප්‍රධානය කිරීමේ වැඩසටහන යටතේ ඔප්පු 60,000 ක් වර්ෂ 03 ක කාලයක් තුල ප්‍රදානය කිරීම සඳහා ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය රු. මි. 219 ක්වූ අතර 2019 අප්‍රේල් 30 දින වන විට සභාව විසින් ඔප්පු 2712 ක් පමණක් ප්‍රධානය කර තිබූ අතර ඒ සඳහා වැය කර තිබූ පිරිවැය රු. 90,915,043 ක් විය. ඒ අනුව ඔප්පුවක් ප්‍රධානයකිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. 3650 ක් වුවත් සභාව දරා තිබූ පිරිවැය රු. 33,523 ක් විය. | පෙර පැවති දුර්වලතාවයන් මහ හරවා ගනිමින් වර්තමානයේදී ඔප්පු බෙදාදීමේ උත්සව අවස්ථාවන්හිදී අඩුම පිරිවැයක් දරමින් වැඩි ඔප්පු ප්‍රමාණයක් බෙදා දීමට කටයුතු සම්පාදනය වෙමින් පවතී. | සැලසුම් හා ඇස්තමේන්තු අනුව අරපිරිමැස්මෙන් වියදම් දැරීම හා ඊට අදාලව කාර්යය සාධනය කාර්යක්ෂමව ඉටු කරගත යුතු වීම. |

4. **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 1/2014 ප්‍රකාරව වාර්ෂික අයවැය, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, මානව සම්පත් සංවර්ධන සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම යන සැලසුම් ඇතුලත්ව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, 2018 වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ එම සැලසුම් ඇතුලත් කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි ඉදිරි වර්ෂයන් සඳහා ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමේ දී අදාල සියලු කරුණු පිළිබඳ අවධානය යොමු කර නිවැරදි වූ ක්‍රියාත්මක සැලැස්මක් සකස් කිරීමට නිලධාරීන් දැනුවත් කල බව දන්වමි. | 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 1/2014 ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. |
| (ආ) | 2004 පෙබරවාරි 24 දිනැති 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂයක් අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවද 2015,2016 හා 2017 වර්ෂ වල වාර්ෂික වාර්තා 2019 අප්‍රේල් 30 දින වන විටත් සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2015 හා 2016 වාර්ෂික වාර්තා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර 2017 වර්ෂයේ පරිවර්තනය අවසන් අදියරේ පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කල යුතුය. |